විමර්ශී 31

## මාධ්‍යය දුටු පොලිස් ත්‍රස්තවාදය

මානුෂවාදී පුවත් වාර්තාකරණයේ මාධ්‍ය ප්‍රවණතා හඳුනා ගැනීමේ උත්සාහයක යෙදී සිටි අපට මග හැර යා නොහැකි ලෙස ජනතාවගේ මූලික අයිතිවාසිකම් දරුණු අභියෝගයට ලක් වන, මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝණය වන සිදුවීම් දාමයක් සමාජය තුළ සිදුවන ආකාරය නිරීක්ෂණය කරන්නට සිදු විය. රටේ නීතිය හා සාමය රකින්නට සිටින පොලීසිය විසින් නීතියේ ආධිපත්‍යය අභියෝගයට ලක් වන ආකාරයට ක්‍රියා කරමින් සැකකරුවන්ට මරණීය දණ්ඩනය පැනවීම හරහා එම මූලික අයිතීන් හා මානව හිමිකම් උල්ලංඝණයන් සිදු වීම ආරම්භ වූයේ හදිසියේම නොවේ. නමුත් ඒ පිළිබඳ ජනමාධ්‍ය හරහා යම් තරමක කතිකාවක් මතු වූයේ පසු ගිය දා සිදු වූ සිදුවීම් දෙකක් හරහාය. ඒ කතිකාව ගොඩ නැගෙන්නට හේතු වූයේද එම සිදුවීම් පසුපස ජනතා බලවේගයක් හෝ වෙනත් බලවේගයක් හෝ ක්‍රියාශීලී වීම නිසාය. සිදුවීම් දෙකෙන් එක සිදුවීමකදී පොලිස් අත්අඩංගුවට පත් (අගෝස්තු 12 රාත්‍රී) තරුණයන් දෙදෙනෙකුගේ වද දී වෙඩි තබා මරණ ලද මළ සිරුරු පසුදා හමු වී තිබුණි. අනෙක් සිදු වීමේදී සහකාර පොලිස් අධිකාරිවරයෙකු ඔහුගේ පුතා සහ බිරිඳගේ මැර ප්‍රහාරවලට ලක්වූ ශිෂ්‍යයකුගේ ජීවිතය අයිආර්සී කාරයෙකුගේ මළ සිරුරක් ලෙස නාමකරණය නොවී අනූනවයෙන් බේරී තිබුණි. පළමු සිදුවීමට ගොදුරු වූ අගුලාන ප්‍රදේශයේ ධනුෂ්ක උදයංග සහ දිනේශ් තරංග යන තරුණයන් දෙදෙනා වෙනුවෙන් එම ප්‍රදේශවාසීන් පොලීසියට එරෙහිව කැරලි ගසන්නට තරම් උණුසුම් වූයෙන් ඒ උණුසුම මාධ්‍ය තුළටද එක් වූයේය. දෙවැනිව කී සිදුවීමේදී (ලිවීම සඳහා පෙළ ගැස්වීම මෙසේ වුවද මාලඹේ තොරතුරු තාක්ෂණ ආයතනයේ සිදුවීම වූයේ පළමුවෙනි.) පැහැර ගැනීමට ලක්වූ සිසුවාගේ දෙමාපියන් වහා ක්‍රියාත්මක වීමට දේශපාලන සබඳතාවකින්ද ශක්තිමත් පුද්ගලයන් වීමෙන් හා තාක්ෂණ ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව සක්‍රීය වීමෙන් ජනමාධ්‍යයද සක්‍රීය වූයේය. නිල බලය තම දරුවාගේ පවා විරුද්ධවාදීන් තුරන් කිරීමට යොදා ගැනීම හා රණවිරු නාමකරණයේ උන්මාදයට මුවාවී හිතුමතයේ මිනිස් දඩයම් කිරීම සෙල්ලමක් කර ගැනීම ගැන පොලීසිය හතර අතින් මාධ්‍යයේ පහර කෑමට ලක් වන්නට පටන් ගත්තේ මේ අවදිවීම් හරහාය.

අපරාධකරුවන් හෝ සැකකරුවන් හෝ ඝාතනය කොට ඒවා සාධාරණීකරණය කිරීමට පොලීසිය විවිධ හේතු දක්වූ වාර ගණනක් පසු ගිය මාස කිහිපය තුළ මාධ්‍ය වාර්තා ඔස්සේම දකින්නට ලැබිණ. නොදරුවන් ඝාතනය කිරීම නිසා අත්අඩංගුවට ගත් සැකකරුවන් කිහිප දෙනෙකුටම අධිකරණය මගින් විනිශ්චය කොට දඬුවම් ලබා දීම වෙනුවට නීතිය අතට ගත් පොලීසිය දඬුවම් දී, ඔවුන් මෙලොවින් තුරන් කොට එම ෆයිල් වසා දමා අත පිසදා ගත්තේය. ලෝකයම සංවේදී දරුවන්ගේ ඝාතන වෙනුවෙන් කම්පා වූ සමාජය නීතියේ - යුක්තියේ ආදර්ශය නොවූ එම දඬුවම් දීමේ අනතුර ගැන නොපෙනුන සිත්ව නිහඬ වූහ. යුද්ධය අවසන් කළ රජය පාතාලය අවසන් කිරීමට ක්‍රියා කිරීම ගැන ප්‍රශංසා කළ මේ රටේ මාධ්‍ය, පොලීසිය විසින් විවිධ හේතු දක්වා අත්අඩංගුවට ගත් පුද්ගලයන් ඝාතනය සාධාරණීකරණය කරන විට එසේම පිළිගෙන නිහඬ වූහ. අත් බැඳ වෙඩි තබා ඝාතනය කර තිබූ තරුණ සිරුරු පාතාල කණ්ඩායම් අතර ගැටුමකින් සිදු වූ බවට සැක කරන බවට පොලීසිය කළ ප්‍රකාශ එසේම ගෙන සමාජයත්, මාධ්‍යයත් දෙපාර්ශ්වයම නිහඬ වූහ. මේ ආරම්භ වන්නේ පොලිස් ත්‍රස්තවාදයට සිවිල් සමාජය බිලි වන ක්‍රියාදාමයක් යැයි ඇස් ඇති මිනිසුන් ටික දෙනෙක් තැනින් තැන නැගූ හඬ හඬක් වූයේ නැත. හේතුව, ඒ හඬ අනාගත නපුර ගැන කියන අනාවැකි ලෙස දකින්නට මාධ්‍යයට ඇස් නැතිවූ නිසා විය හැකිය. පාතාලයන් සමාජයෙන් අතුගා දැමීමේදී නීතියක් යුක්තියක් ක්‍රියාත්මක විය යුතු නැතැයි විශ්වාස කළ නිසා විය හැකිය. නමුත්, ඕනෑම සැකකරුවකුට, අපරාධකරුවකුට අධිකරණය මගින් විනිශ්චයක් ලබා ගැනීමට ඇති මූලික අයිතිය විනාශ වන හැටි බලා සිටින සමාජයකට ඕනෑම අහිංසක පුරුෂයකු හෝ ගැහැණියක හෝ අපරාධකරුවකු, පාතාලයකු කර සමාජයෙන් අතුගා දමන හැටි බලා සිටින්නට සිදු වීමේ අනතුර දැනෙන්නේ එය තමා ළඟටම ආ පසුය. එලෙස පොලිස් ඝාතන ගැන නිහඬ වූ සමාජයකට තමන්ගේ දරුවා, ඥාතියා, මිත්‍රයා වෙනුවෙන් යුක්තිය ඉල්ලා සටන් කරන්නට සිදු වී ඇත. ඒ ඔවුන් පාතාලයන් කරන්නට උත්සාහ කළද පොලීසියට එය කළ නොහැකි වූ බැවිනි.

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

මාධ්‍යයට එදා නොතිබූ හඬ අද ලැබී ඇත්තේද ඒ නිසා විය හැකිය. වාර්තාකරණයේ වෙනස කැපී පෙනෙන්නේද ඒ නිසා විය හැකිය.

අගෝස්තු මස 10 වැනිදා සිට 16 දක්වා අතර දින හයක කාලය තුළ සිංහල පුවත්පත් අඟුලානේ තරුණයන් දෙදෙනාගේ ඝාතනය සම්බන්ධයෙන් කැපී පෙනෙන වාර්තාකරණයක යෙදී ඇත. එම කාලය තුළ ප්‍රධාන පුවත් 5ක්, කතුවැකි 6ක් මෙන්ම කැරලි ගැසූ ජනතාව දැක්වෙන ඡායාරූප රැසක්ද දක්නට ලැබිණ. පුවත්/විශේෂාංග 29ක් පමණ පළ විය. රජයේ මාධ්‍ය පුවත්පත එක් ප්‍රධාන සිරස්තලයකින් සිදුවීම වාර්තා කර තිබුණත් පෙර සිදුවීම් ලෙස ඔවුන් පාතාල සාමාජිකයන් බවත්, වෙනත් කණ්ඩායමක් විසින් ඝාතනය කරන්නට ඇති බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශක මූලාශ්‍ර කොට ගෙන වාර්තා කර ඇත. ජනතා උද්ඝෝෂණවලින් වූ හානි ගැන සඳහන් කර ඇතත් ඝාතනය වූ තරුණයන් වෙනුවෙන් සාධාරණය ඉටු කිරීම සම්බන්ධයෙන් කිසිවක් සඳහන් නැත. අනෙකුත් සියළු පුවත්පත් සමස්තයක් ලෙස පොලීසියේ ක්‍රියා කළාපය දැඩි ලෙස විවේචනය කර ඇති අතර ඔවුන් වරදක් කර ඇත්නම් දඬුවම් දීමේ ක්‍රමය එය නොවන බවද එයට රටේ නීතියක් ඇති බවද මතක් කර දී ඇත. අඟුලාන පොලීසියේ නිලධාරියකු හා සම්බන්ධ කාන්තාවකට විහිළු කරීම නිසා තරුණයන් අත් අඩංගුවට ගත් බව මාධ්‍ය වාර්තා කර තිබිණ. නිරීක්ෂණය කළ දින කිහිපයට පසු එක් සති අන්ත පුවත්පතක් (රාවය) එම සිදුවීම ගැන සවිස්තර කරුණු සොයා ලියන ලද ලිපියක එදින ඇතිවූ සිදුවීම ඉතා හොඳින් පැහැදිලි කර තිබීම කැපී පෙනෙයි. ඒ අනුව එම විහිළුවලට ලක්වූ කාන්තාව සුනාමියෙන් අවතැන්වූ අඟුලාන පිට්ටනිය පසෙක තනා ඇති තාවකාලික නිවසක ජීවත් වී ඇත. ඇය පොලිස් නිලධාරියකු සමඟ සම්බන්ධතාවක්ද පවත්වා ඇති බවට ආරංචි ඇත. තරුණයන් මත්පැන් බීමට පැමිණෙන්නේ ඇගේ නිවස ආසන්නයේ මෙම පිට්ටනියටය. එදින මෙම තරුණයන් දෙදෙනාද මත්පැන් බී ඇයට විහිළු කර ඇති බව, සිගරට් බීමට ගිනි පෙට්ටිය ඉල්ලා එය දෙන විට අතින් ඇල්ලූ බව වැනි කරුණු ඔවුන් සමඟ සිටි තරුණයන් අනාවරණය කර ඇත. කැමැත්තෙන් හෝ කරන්නට සිදු වී ඇති නිසා හෝ කෙනෙක් සමඟ සම්බන්ධතාවක් පවත්වන කාන්තාවක් අනෙක් සියළු පුරුෂයන් සමඟ යහන්ගත වෙන්නට කැමැති යැයි සිතන්නේනම් හෝ එසේ කළ යුතු යැයි සිතන්නේනම් ඒ ඔලු සුද්ද කිරීම වෙනම කළ යුතු කටයුත්තකි. ස්ත්‍රිය සම්බන්ධයෙන් එවැනි අගතිගාමී ලෙස හා ලිංගික ඉරිසියාවෙන්, ලිංගික කුහකකමෙන් පෙළෙන සමාජයක ඔලු සුද්ද කිරීමේ සමාජ මෙහෙවරට උරදීමට මෙම සිදු වීම වුණත් මාධ්‍යයට හොඳ ප්‍රවිශ්ඨයක් කර ගත හැකිය. කෙසේ වුවත් එවැනි බලපෑමකින් බේරෙන්නට එම කාන්තාව පොලීසියට නිල වශයෙන් පැමිණිලි කළානම් හෝ හිතවත් නිලධාරියාට වාචිකව දැනුම් දුන්නානම් එය ඇයට ගන්නට තිබූ පියවර විය හැකිය. නමුත්, පොලීසියේ පැමිණිලි විභාග කිරීම සිදු විය යුත්තේ වද දීමෙන් හා තුවක්කුවෙන් කතා කිරීමෙන්ද? මෙම තත්ත්වය ඉහත කී පුවත්පත වඩා නිරවුල්වත් තවත් ලිපි හා කතුවැකි මඟින් යම් යම් මට්ටමිනුත් විග්‍රහ කර තිබීම, ප්‍රමාද වී අවදි වුවද මාධ්‍ය මඟින් සිදු විය යුතුව තිබූ දෙයකි. එමෙන්ම ඉහත කී කාන්තාවගේ පැල්පත මුළුමනින්ම ගිනිබත් කර ඇති ආකාරය ඉහත කී සිංහල පුවත්පත මෙන්ම ඉංග්‍රීසි පුවත්පතක් (සන්ඩේ ලීඩර්) ඡායාරූපයක් සහිතව වාර්තා කර ඇත. මෙම සිදුවීම් හරහා එම කාන්තාව මුහුණ දී ඇත්තේ දැඩි ජීවිත අවදානමකට බව මේ අනුව පෙනේ. එහෙත් ඒ සම්බන්ධයෙන් අවධානයක් දක්වා ඇති බව නොපෙනේ. පරිඝණක තාක්ෂණ ආයතනයේ සිසුවාගේ සිදුවීම සම්බන්ධයෙන්ද ප්‍රමුඛතාවයෙන් යුතු වාර්තාකරණයක් (වාර්තා 24ක්) දකින්නට ලැබුණු අතර මේ කාලය තුළ සමහර පුවත් පත් මෙම පොලිස් ත්‍රස්තවාදය ගැන සටහන් කර තිබුණේ සිදුවීම් දෙකම එකට ගනිමිනි.

දෙමළ පුවත්පත්වල සිදුවීම් දෙකටම අදාලව පළවී ඇත්තේ පුවත් 8ක් පමණය. මෙම සිදුවීම්වලින් ඉඟි කෙරෙන ප්‍රජාතන්ත්‍රවාදයේ විනාශය පිළිබඳ කිසිදු විග්‍රහාත්මක ලිපියක් කතුවැකියක් පළ කොට නැත. තම තමන්ගේ ජන කණ්ඩායම් ඉලක්ක කොට ගත් මාධ්‍ය හැසිරවීමේ පරස්පරයට මෙය උදාහරණයක් ලෙස ගත හැකිය. දෙමළකමට එරෙහිව ඝාතන හස්තය ක්‍රියාත්මක වන විට දෙමළ මාධ්‍ය හැර අනෙකුත් මාධ්‍ය එය ''අපේ නොවන අනෙකා නිසා'' වගකීමක් ගන්නේ නැත. අපරාධකරුවන් නඩු නැතිව විනාශ කිරීමටත්, පාතාලය නාමයෙන් ඝාතන කිරීමටත් එම මර්දන හස්තය දිගු කරන විට, එයින් ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම ඉක්මන් වේයැයි කීමට තරම් වගකීමක් දෙමළ මාධ්‍යද ගන්නේ නැත.

සිදුවීම් දෙකම සම්බන්ධ පුවත්/විශේෂාංග/කතුවැකි/කාටූන් 24ක් පමණ ඉංග්‍රීසි පුවත්පත්වලද පළ කර තිබූ අතර විවිධ මූලාශ්‍ර හරහා පොලීසියේ දූෂිත ක්‍රියාකළාපය විවේචනයට ලක් කර

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

තිබුණි. රජයේ මාධ්‍ය ඉංග්‍රීසි පුවත්පත (ඩේලි නිවුස්) ඉතා කුඩා පුවතකට පමණක් සීමා වී ඇත. සිදුවීමේ අදියරයන්, බලධාරීන් කළ ප්‍රකාශ හා ගන්නා ලද තීන්දු ආදිය ගැන සැලකිය යුතු වාර්තා ප්‍රමාණයක් රූපවාහිනී මාධ්‍ය මඟින්ද විකාශනය විය. නමුත්, මෙම ක්‍රියාවල අනාගත භයානක වර්ධනයන් ගැන සමාජය දැනුවත් කිරීමේ සංවාදයක් ගොඩ නැගීමට ප්‍රබල මැදිහත් වීමක් ඒවායින් දකින්නට නැත.

**සීතා රංජනී**
**seetha@cpalanka.org**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com